S0145

(සියලුම හිමිකම් ඇවිරිණි)

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

### ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (1)

### සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (09)

**කාලය පැය 03 යි.**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.**

---

01. ශ්‍රී ලංකාවේ යහපාලනය තහවුරු කිරීම සඳහා පාලන යන්ත්‍රය (Administrative Machinery) විසින් පාලන තන්ත්‍රය (Administrative Regime) වෙත කළහැකි සාධනීය බලපෑම් විග්‍රහ කරන්න.

02. රටක මානව සම්පත් සංවර්ධන ක්‍රියාවලිය රටේ ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම අරමුණු කොට සංවිධානය විය යුතුය. මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද ජාතික මානව සම්පත් හා රැකී රක්ෂා ප්‍රතිපත්තිය ඇසුරින් විග්‍රහ කරන්න.

03. රටක නීතියෙහි ආධිපත්‍යය තහවුරු කිරීම සඳහා විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය එකිනෙකින් ස්වාධීන (independent) විය යුතු වුවත්, අන්‍යොන්‍ය වශයෙන් ස්වායත්ත (mutually exclusive) නොවිය යුතුය. සාකච්ඡා කරන්න.

04. ශ්‍රී ලංකාවේ නිදහස් සෞඛ්‍ය සේවයේ ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන වෙතින් ලබාදිය හැකි දායකත්වය විශ්ලේෂණය කරන්න.

05. ශ්‍රී ලංකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තුවලට සාපේක්ෂව රාජ්‍ය සංස්ථාවල පරිපාලනය හා මූල්‍ය කළමණාකරනය වඩාත් නම්‍යශීලී පදනමක පිහිටයි. මෙම ප්‍රවණතාවයෙහි වාසි හා අවාසි ආර්ථිකයේ ප්‍රධාන ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ලේෂණාත්මකව දක්වන්න.

06. පළාත් පාලන ආයතනයන්හි මනා ක්‍රියාකාරීත්වය රටේ සංවර්ධනය සහ සමාජ සුබසාධනය සඳහා ඉහල දායකත්වයක් සපයයි. විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

07. ප්‍රාදේශීය මට්ටමෙන් සංවර්ධන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ දේශපාලන අධිකාරිය, රාජ්‍ය ආයතන හා සිවිල් සමාජය අතර මනා සම්බන්ධීකරණයේ වැදගත්කම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න

08. පහත සඳහන් මාතෘකා පිළිබඳව කෙටි සටහන් ලියන්න

    1. මානව හිමිකම් කොමිෂන් සභාව
    2. පාර්ලිමේන්තු උපදේශක කාරක සභා
    3. පළාත්සභා ප්‍රඥප්ති
    4. මහජන පෙත්සම් කාරක සභාව

************